# ඉස්ලාමයට සපැමිණි නවකයින් සඳහා දහම් බිඳක්

﴿ نصائح مختصرة للمسلم الجديد ﴾

[ Sinhalese – سنهالي ]

පරිවර්තනය: මුහම්මද් නලීම් ඉස්සදීන

2011 - 1432

IslamHouse.com

# ﴿ نصائح مختصرة للمسلم الجديد ﴾

« باللغة السنهالية »

ترجمة: محمد نظيم عز الدين

2011 - 1432

IslamHouse.com

# ඉස්ලාමයට සපැමිණි නවකයින් සඳහා දහම් බිඳක්

**1.** නිසකවම ඉස්ලාම් ධර්මය යනු අල්ලාහ් දෙවියන් වහන්සේට අයත් ධර්මයකි. එබැවින් ඉස්ලාම් ධර්මය පළිගෙන එහි ප්‍රවිශ්ඨ වීම අල්ලාහ් කෙරහි තිබෙන්නා වූ බිය බැතියෙන් පමණක් සිදු විය යුතු අතර ලෞකික ලාභ ප්‍රයෝජන බලාපොරොත්තුවෙන් සිදු නොවිය යුතුයි.

**2.** කෙනෙකු විසින් සත්‍ය අවබෝධ කර ගැනීමෙන් පසු එහි මත පිහිටා කටයුතු කිරීම අවශ්‍ය වේ. එම ගමනේදී මුහුණ පෑමට සිදුවන කරදර කම්කටොලු සියල්ල විඳ දරා ගැනීමට ආත්ම ශක්තිය හා ඉවසීම ඔබ විසින් ඇති කර ගැනීම අවශ්‍ය වේ.

**3.** ඉස්ලාම් දහම දායාදයක් වශයෙන් ලබා දුන් අල්ලාහ් තආලාට තුති පුද කළ යුතුයි. එසේ තුති පුද කිරීමේ ලක්ෂණයක් නම් ඔබ ප්‍රිය කරන දෙයක් අනුන් කෙරෙහිද ප්‍රිය කිරීමයි. එබැවින් දෙවියන් වහන්සේ වෙනුවෙන් පිළිගත් මෙම උතුම් ධර්මය ඔබ දන්නා හඳුනන හා නොහඳුනන අයට ප්‍රචාරය කිරීමට වග බලා ගන්න.

**4.** ඉස්ලාම් ධර්මය අරාබිවරුන්ට හෝ නැත්නම් අරාබි නොවන අයට හෝ අයිති බූදලයක් නොවේ. එබැවින් මෙම ධර්මය තුළට කෙනෙකු ඇතුල්වන්නේද ඒ හැම දෙනාටම එහි ධාර්මික රසය භුක්තිවිඳීමට අයිතියක් ඇත. එහිදී තරාතිරම පිළිබඳ ප්‍රශ්නයක් පැණ නගින්නේ නැත. එබැවින් මෙම ධර්මය කෙනෙකු විසින් යටහත් භාවයෙන් සහ භියබැතියෙන් අනුගමනය කරන්නේද අල්ලාහ් තආලා ඉදිරියේ ඔහු විශිෂ්ඨ වූ කෙනෙකු වශයෙන් හා මරණින් මතු දිනයේ දී උත්තරීතර කෙනෙකු බවට පත්වන්නේය.

**5.** ඉස්ලාමයට ඇතුල් විමෙන් පසු ඔබට යහපත් දනන් හමුවීමට සිදුවෙන්නාක් මෙන්ම අයහපත් දනන්ද හමු වීමට හැක. දුදනන් විසින් ඔබ ධර්මයෙන් වළක්වාලීමට හැක. නැත්නම් ආගම් ධර්මයෙන් දියුණු විමේ මාර්ගයට අකුල් හෙළීමට හැක. එබැවින් ඔබ විසින් කල්පනා කාරීව සහ ඉවසීමකින් යුතුව කටයුතු කිරීම අවශ්‍ය වේ.

**6.** අපට උදව් උපකාර කිරීමට හා අපේ අවශ්‍යතා ඉටු කිරීමට හැකි එකම බලවතා අල්ලාහ් තආලා පමණි, එබැවින් ඔබේ සිතේ

ඇති පවිත්‍ර සිතුම් පැතුම් ඔහු විසින් හොඳින් හඳුනා ගන්නේ නම් ඔහු ඔබට මෙලොවදී සහ මරණින් මතු දිනයේදී පිහිට වෙනවාට කිසිම සැකයක් නැත.

**7.** ඉස්ලාම් යනු අල්ලාහ් තආලා විසින් මිනිසාගේ යහපත් දිවි පැවැතුම සඳහා නිර්මාණය කරන ලද ජීවන සැළැස්මක් වේ. එබැවින් එහි නීති ගරුක විනය ගරුක සමාජ ක්‍රමයක් සඳහා නීති රීතිද සම්පාදනය වී ඇත. මෙම ජීවන සැළැස්ම අනුගමනය කරන දනන් විසින් මෙම ධර්මයට අනුකූලව කටයුතු කිරීමට හැකි අතර එම ධර්මයට බැහැරව කටයුතු කිරීමටද හැක. මෙම ධර්මය අදහන අය විසින් කරන වැරදි සහගත ක්‍රියා ඉස්ලාම් ධර්මය තක්සේරු කරන මිණුම් දණ්ඩක් නොවේ.

**8.** ඔබ මෙම ධර්මයට ඇතුල් වීම නිසා කීර්ති ප්‍රශංසාවට ලක් වීමට හැක. නමුත් වැදගත් වන්නේ අල්ලාහ් තආලා විසින් ඔබේ සිත් සතන් තුල පැල්පදියම් වී ඇති ස්ථාවර විශ්වාසය දෙස බලා ඔබ අගය කිරීමයි.

**9.**ඉස්ලාම් මිනිස් සත්වයාගේ සම්පූර්ණ වූ ජීවන සැළැස්මක් වේ. එබැවින් ඉස්ලාම් ධර්මය සලාතය ඉටු කිරීම, උපවාසය රැකීම, සකාත් හෙවත් දුගී බද්ධ ප්‍රධානය කිරීම හා හජ් ඉටුකිරීම වැනි ප්‍රධානය වගකීම් ඉටු කරන ලෙස අණ කරන අතර සත්‍ය කතා කිරීම, නැති බැරි දුගී දුප්පත් ජනතාවට කරුණාව දැක්වීම, දෙමව් පියන්හට ඇප උපස්ථාන කිරීම, වැනි සාර ධර්ම උගන්වනයි. මත්පැන් පානය කිරීම, දුරාචාරයේ හැසිරීම, අනුන්ට අපරාධ හිරිහැර කිරීම, වැනි සමාජ විරෝදී ක්‍රියා වළක්වාලයි. කෙටියෙන් සඳහන් කරන්නේ නම් සියළු යහපත් ක්‍රියා අනුමත කරන අතර සියළු අයහපත් ක්‍රියා තහනම් කරයි.

**10.** යහපත් දනන් සහ අයහපත් දනන් තොරා බේරා වෙන් කරගැනීමට සහ සත්‍ය හා අසත්‍ය වාදීන් හඳුනා ගැනීමට අල්ලාහ් තආලා විසින් මෙලොව ජීවිතය නිර්මානය කරන ලදි. දුදනන් හට අල්ලාහ්ගේ දැඩි පරීක්ෂනයට ලක් විමටද සිදු වනු ඇත. මෙම කරුණු ගැන ඔබ විසින් හොඳින් වටහා ගත යුතුයි.

**11.** සත්පුරුෂ මුස්ලිම් වරයෙකුගේ ලක්ෂණය නම් ඔහු හැම විටම වීර්ය හා සන්සුන් පිළිවෙතක් අනුගමනය කිරීමයි. ධර්මයෙහි ඉගැන්වීම් අනුව සිය ජීවිතය හැඩගස්වා ගනී. එසේම තමන්

අදහන ධර්මය ගැන නිතර සාඩම්බර වන අතර අනුන්ටද එය ප්‍රචාරය කිරීමෙහිලා උනන්දු වෙයි. මිනිසුන් හඳුනා ගැනීමේදී බුද්ධිමත් වෙයි.

**12.** ඉස්ලාම් යනු වචනයෙන් පමණක් ලාඉලාහ ඉල්ලල්ලාහ් යන කලිමාව උච්චාරනය කරන ධර්මයක් නොවේ. එහි අරමුණ මිනිස් ජීවිතයේ සියළුම ක්ෂේත්‍රයන් සඳහා දහම් එළිය පෙන්වීමයි. එබැවින් ඉස්ලාම් ධර්මය යනු නීතිය, සදාචාරය, සංස්කෘතිය යන සියළු මංපෙත් වලින් සමන්විත ධර්මයක් වේ. එබැවින් පියවරින් පියවර මෙම ධර්මය ඇදහීම කෙරෙහි උත්සහ කරන්න, එවිට අල්ලාහ් අල්කුර්ආනයෙහි සඳහන් කරන ආකාරයට “ ʿඅල්ලාහ් කෙනෙකුගේ හදවත ඉස්ලාමය වෙත විවෘත කරන්නේද ආරක්ෂකයානන්ගේ පිහිටෙන් ඔහුගේ ජීවිතය ආලෝකමත් වේ.

**13.** ඉස්ලාමිය මධ්‍යස්ථානයන්හි පවත්වනු ලබන ඉස්ලාම් පාඨ මාලාවන්වලට සහභාගි වී මෙම ධර්මය නිසියාකාරව හැදෑරීමට උත්සහ කරන්න.

ඔබට අල්ලාහ් තආලාගේ පිහිට හා ආශිර්වාදය ලැබේවා!

පරිවර්තනය : මුහම්මද් නලීම් ඉස්සදීන්


المكتب التعاوني للدعوة وتوعية الجاليات بالربوة
ISLAMIC PROPAGATION OFFICE IN RABWAH
P.O.BOX 29465 RIYADH 11457 - TEL 4454900 - 4916065
FAX 4970126 - E-Mail:rabwah@www.com


***********